සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 81 S I,II

නම: ..........................................

## කෘෂි හා ආහාර තාක්ෂණය

කාලය පැය තුනයි

සැලකිය යුතුයි :

## I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වලට දී ඇති (I) (ii) (iii) (iv) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**
- **දී ඇති පිළිතුරු පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරට අදාළ අංකයට හිමි කවය තුළ (×) ලකුණ යොදන්න.**

01) වැවක අංගයක් වන බිසෝ කොටුව මගින් ඉටුකෙරෙන කාර්ය වනුයේ.
   i) වැව් බැම්මට ආරක්ෂාව සැපයීමයි.
   ii) අතිරික්ත ජලය පිටකර හැරීමයි.
   iii) සොරොව්වෙන් පිටකරන ජලයේ පීඩනය පාලනය කිරීමයි.
   iv) අවශ්‍ය කටයුතු සඳහා ජලය මුදාහැරීමයි.

02) හරිත විප්ලවය සමයේ කෘෂි කර්මාන්තයේ සිදුවූ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

   A - වැඩි දියුණු කරන ලද බෝග ප්‍රභේද හඳුන්වාදීම.
   B - කාබනික පොහොර භාවිතය ජනප්‍රිය වීම.
   C - අතිරික්ත නිෂ්පාදන අළෙවිකිරීමට ප්‍රමුඛතාවය ලබාදීම.

   ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වනුයේ,
   i) A හා B ය. ii) A හා C ය. iii) B හා C ය. iv) AB හා C සියල්ලම.

03) අනුරාධපුර යුගයේ ඉදිකරන ලද ප්‍රථම වැව ලෙස හැඳින්වෙන්නේ,
   i) තිසා වැවයි. ii) කලා වැවයි. iii) නුවර වැවයි. iv) බසවක්කුලම වැවයි.

04) වෙල් (කුඹුරු) ලක්ෂයක් තිබුණු නිසා '' වෙල්ලස්ස'' ලෙස ජනප්‍රවාදයේ පැවත එන ප්‍රදේශය අයත් වන්නේ,
   i) ඌව පළාතට ය. ii) සබරගමු පළාතයට ය.
   iii) වයඹ පළාතට ය. iv) නැගෙනහිර පළාතට ය.

05) දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටනු ලැබුවේ,
   i) 1822 දී ය. II) 1960 දී ය. iii) 1912 දී ය. iv) 1972 දී ය.

06) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

   i) ධාතුසේන රජතුමා '' මින්නේරි දෙවියන් '' ලෙස දේවත්වයෙන් පුදනු ලැබුවේය.
   ii) අළහැර ඇළ ඔස්සේ මින්නේරිය වැවට හා කන්තලේ වැවට ජලය ලබාදීම අතීත වාරි තාක්ෂණය සඳහා නිදසුන් වේ.
   iii) අඹන් ගඟ හරස්කොට ඇළහැර අමුණ ඉදිකරන ලද්දේ මහා පරාක්‍රමබාහු රජතුමාය.
   iv) තිසා වැවේ සිට කලා වැවට ජලය ගෙනයමට ඉදිකළ ජය ගඟ හෙවත් යෝධ ඇළ ඉතිහාසයේ වැදගත් වාරි නිර්මාණයයි.

07) වඩාත් නිවැරදි පාඨාංක ලබාගැනීම සඳහා වර්ෂාමානයක් ස්ථාපනය කිරීමේදී එහි පුනීල කට පැවතිය යුත්තේ පොළොව මට්ටමේ සිට,
   i) 10 cm ඉහළිනි. ii) 20 cm ඉහළිනි iii) 30 cm ඉහළිනි. iv) 40 cm ඉහළිනි.

08) සුලං දිශා දර්ශකයක පිහිටීම රූපයේ දැක්වේ. ඒ අනුව සුලඟ හමා එන දිශාව වන්නේ,




   i) නැගෙනහිර සිට බටහිර දෙසට ය.
   ii) උතුර සිට දකුණ දෙසට ය.
   iii) දකුණ සිට උතුර දෙසට ය.
   iv) බටහිර සිට නැගෙනහිර දෙසට ය.

09) පුෂ්ප හටගැනීම සඳහා කෙටි දිවා කාලයක් අවශ්‍ය වන බෝග වනුයේ,
i) උක්, කෝපි හා ස්ට්‍රෝබෙරිය
ii) කැරට්, බීට්, හා රාබුය.
iii) පොල්, මිරිස් හා වී ය.
iv) දුම්කොළ , ආර්තාපල් හා තක්කාලිය.

10) ලංකාවට වැසි ලැබෙන ක්‍රම, කාල සීමා හා ඊට අයත්වන වගාකන්න පිළිබඳව සටහනක් පහත වගුවේ දැක්වේ. එහි නිවැරදිව දක්වා ඇති පේළිය අයත් පිළිතුර තෝරන්න.

| | වැසි ලැබෙන ක්‍රමය | වැසි ලැබෙන කාලසීමාව | වගාකන්නය. |
|---|---|---|---|
| i) | පළමුවන අන්තර් මෝසම් වැසි | දෙසැම්බර් - පෙබරවාරි | මහ කන්නය. |
| ii) | නිරිත දිග මෝසම් වැසි | මැයි - සැප්තැම්බර් | යල කන්නය. |
| iii) | සංවහන වැසි | ඔක්තෝම්බර් - නොවැම්බර් | යල කන්නය. |
| iv) | ඊසාන දිග මෝසම් වැසි | මැයි - සැප්තැම්බර් | මහ කන්නය. |

11) රූපයේ දැක්වෙන උපකරණය වනුයේ,
i) පීඩන මානයයි.
ii) ආර්ද්‍රතා මානයයි.
iii) සූර්ය දීප්ත මානයයි.
iv) සූර්ය විකිරණ මානයයි.



12) කෘෂි දේශගුණික කලාප හැඳින්වීමේදී DL සංකේතයෙන් දැක්වෙන්නේ,
i) පහතරට තෙත් කලාපය යි.
ii) පහතරට අතරමැදි කලාපය යි.
iii) පහතරට වියළි කලාපය යි.
iv) මැදරට අතරමැදි කලාපය යි.

13) ශාක පෝෂක, ශාකයට ලබාදෙන මාධ්‍ය ලෙස ක්‍රියාකරනු ලබන්නේ,
i) ක්ෂුද්‍ර ජීවීන් ය. ii) කැටායන හුවමාරු ධාරිතාවය යි. iii) පංශු ජලය යි. iv) පාංශු වයනය යි.

14) පස් අංශුවල සාපේක්ෂ ව්‍යාප්තිය ලෙස හඳුන්වනු ලබන ලක්ෂණය කුමක්ද?
i) පාංශු වයනය. ii) පාංශු ව්‍යුහය. iii) පාංශු ගැඹුරයි. iv) පාංශු වර්ණයයි.

15) පසක් නිර්මාණය වීමේ ක්‍රියාවලිය නිවැරදිව දක්වන පිළිතුර වන්නේ,

i) පාෂාණ —පාෂාණ ජීර්ණය→ මාතෘ ද්‍රව්‍ය —පාංශු ජනනය→ පස
ii) පාෂාණ —පාංශු ජනනය→ මාතෘ ද්‍රව්‍ය —පාංශු ජීර්ණය→ පස
iii) පාෂාණ —පාංශු ජීර්ණය→ පස —පාංශු ජනනය→ මාතෘ ද්‍රව්‍ය
iv) මාතෘ ද්‍රව්‍ය —පාංශු ජීර්ණය→ පාෂාණ —පාංශු ජනනය→ පස

16) ආග්නේය පාෂාණ සඳහා උදාහරණයක් වන්නේ,
i) නයිස් ය. ii) කිරිගරුඬ ය. iii) ග්‍රැනයිට් ය. iv) ෂෙල් ය.

17) පාංශු ගැඹුර ලෙස හඳුන්වන්නේ පාංශු පැතිකඩෙහි,
i) A හා B කලාප උස ය.
ii) A,B හා C කලාප උස ය.
iii) A,B,C හා D කලාප උස ය.
iv) A කලාපය ය.

18) වර්ගීකරණයට අනුව මැටි ඛණිජ අයත් වන විශ්කම්භය කුමක්ද?
i) මිමී. 2ට වඩා වැඩි අංශු ය.
ii) මි.මි 2-0.2 අතර අංශු ය.
iii) මී.මී. 0.2 - 0.02 අතර අංශු ය.
iv) මි.මි 0.02ට වඩා කුඩා අංශු ය.

19) කේෂාකර්ශන ජලය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ගුරුත්වාකර්ෂණ බලය යටතේ පහළට යෑමට නොදී ඉහළට ඇදගන්නා ජලය ය.
B - කේශික සිදුරු තුළින් ඉහළට ඇදී යන ජලයයි.
C - පාංශු අංශු වටා තදින් බැඳී පවතින ජලයයි.

නිවැරදි ප්‍රකාශය වන්නේ,

i) A හා B ය. ii) A හා C ය. iii) B හා C ය. iv) A,B, හා C ය.

20) පසෙහි පාංශු වාතය නොමැති අවස්තාවක් වන්නේ,
i) ස්ථිර මැලවීමේ අවස්ථාව ය.
ii) ජලයෙන් සන්තෘප්ත වන අවස්ථාව ය.
iii) ක්ෂේත්‍ර ධාරිතා අවස්ථාව ය.
iv) ක්ෂේත්‍රධාරිතාවයෙන් 50%ක් ජලය ඉවත් වූ අවස්ථාව ය.

21) පතෝල, කඩල, කුරක්කන් යන බෝග අයත්වන කුල නිවැරදි ව දක්වා ඇති පිළිතුර වන්නේ,

i) කුකර්බිටේසියේ, ෆැබේසියේ , පෝඒසියේ ය.
ii) ෆැබේසියේ, කුකර්බිටේසියේ, පෝඒසියේ ය.
iii) පෝඒසියේ, කුකර්බිටේසියේ, ෆැබේසියේ ය.
iv) කුකර්බිටේසියේ, පෝඒසියේ, ෆැබේසියේ ය.

22) ඉල්මැස්සාගේ හානිය පාලනය සඳහා යොදා ගත හැකි ක්‍රමයකි,

i) කකර්බිටේසියේ කුලයේ බෝග වගාවෙන් පසු ෆැබේසියේ කුලයේ බෝග වගා කිරීම ය.
ii) කුකර්බිටේසියේ කුලයේ බෝග වගාවෙන් පසු කෘෂිපරේසියේ කුලයේ බෝග වගාකිරීම ය.
iii) කුකර්බිටේසියේ කුලයේ බෝග වගාවෙන් පසු සොලනේසියේ කුලයේ බෝග වගාකිරීම ය.
iv) කුකර්බිටේසියේ බෝග වගාවෙන් පසු මැල්වේසියේ කුලයේ බෝග වගා කිරීම ය.

23) ප්‍රයෝජන අනුව බෝග වර්ගීකරණයේදී මුං, කව්පි, උඳු අයත්වන බෝග කාණ්ඩය වනුයේ,

i) එළවළු බෝග කාණ්ඩයට ය. ii) කෙඳි බෝග කාණ්ඩයට ය.
iii) මාෂ බෝග කාණ්ඩයට ය. iv) කුළුබඩු බෝග කාණ්ඩයට ය.

24) විද්‍යාත්මක බෝග වර්ගීකරණයේ නිවැරදි අනුපිළිවෙල සහිත පිළිතුර වන්නේ,

i) කුලය, විශේෂය, ඝනය, ප්‍රභේදය ලෙස ය.
ii) කුලය, ප්‍රභේදය, ඝනය, විශේෂය ලෙස ය.
iii) ඝනය, කුලය,විශේෂය, ප්‍රභේදය ලෙස ය.
iv) කුලය, ඝනය, විශේෂය, ප්‍රභේදය ලෙස ය.

25) කිසියම් බෝගයක් භූමියේ සිටුවීමට පෙර පස හා සම්බන්ධව සිදුකරන සියලුම ක්‍රියාකාරකම් ඇතුළත් වරණය තෝරන්න.

i) ප්‍රාථමික බිම් සැකසීම. ii) මූලික බිම් සැකසීම.
iii) ද්විතියික බිම් සැකසිම. iv) අතුරුයත් ගෑම.

26) බෝග වගා කිරීම සඳහා වියළි කලාපයට යෝග්‍යතම පාත්ති වර්ගය වනුයේ,

I) උස් වූ පාත්තිය. ii) වැටි හා කාණුය. iii) තනි වගා වළවල්ය. iv) ගිල්වූ පාත්තිය.

27) වැටි හා කාණු සැකසීම සඳහා භාවිතා කරන උපකරණය කුමක්ද?

i) රිජරය ii) රේක්කය iii) යකඩ නගුල iv) තැටි නගුල

28) භාවිතා කරන අවස්ථාව අනුව ප්‍රාථමික බිම් සැකසීමට යොදා ගන්නා උපකරණ කාණ්ඩය සහිත වරණය තෝරන්න.

i) තැටිපෝරුව, ඇණදත්පෝරුව, තැටි නගුල
ii) තැටි නගුල, හැඩලෑලි නගුල, ජපන් පරිවර්ත්‍ය නගුල
iii) ඇණදත් පෝරුව, තලපෝරුව, තැටි නගුල
iv) ජපන්පරිවර්ත්‍ය නගුල, තලපෝරුව, කොකු නගුල

29) බෝග සංස්ථාපන ක්‍රම භාවිතයේදී ත්‍රිකෝණ ක්‍රමයට සිටුවන බෝගයක් වන්නේ,

i) අඹය. ii) කෙසෙල්ය. iii) දොඩම්ය. iv) අන්නාසිය.

30) FMRC ගොඩ බීජ වප්කර භාවිතා කරමින් සිටුවන ලබන බෝග කාණ්ඩය තෝරන්න.

i) බඩඉරිඟු, සෝයා බෝංචි හා මුං
ii) වී, බඩඉරිඟු හා තල
iii) වී, සෝයා බෝංචි හා තල
iv) බඩඉරිඟු, වී හා මුං

31) පස් කුට්ටියක් සමඟ පැළ වෙන්කරගත හැකි තවාන් ක්‍රමය වන්නේ,

i) නොරිදෝකෝ තවාන්ය. ii) ගිල්වූ තවාන්ය. iii) බඳුන් තවාන්ය. iv) උස් තවාන්ය.

32) තවාන් තැටි භාවිතයෙන් පැළ ලබාගන්නා බෝග වර්ග කුමක්ද?

i) වට්ටක්කා, පිපිඤ්ඤා, තක්කාලි හා බටු
ii) දෙමුහුම් බෝග ප්‍රභේද, ගෝවා, බටු හා තක්කාලි
iii) දෙමුහුම් බෝග ප්‍රභේද, කරවිල, බටු හා ගෝවා
iv) ගෝවා, පිපිඤ්ඤා, කරවිල හා බටු

33) තවානක් ජීවාණුහරණය කිරීමට සුදුසු හිතකර ක්‍රමය මින් කුමක්ද?

i) පිළිස්සීම මගින් ii) සූර්යතාපය මගින්
iii) රසායනික ද්‍රව්‍ය මගින් iv) ධූමකරණය මගින්

34) නීරෝගී සාර්ථක පැළ ලබාගැනීමට තවාන හොඳින් නඩත්තු කිරීම කළයුතුය. ඒ සඳහා අනගමනය කල යුතු කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A) ජලසම්පාදනය කිරීම.
B) වල් මර්දනය කිරීම.
C) රසායනික ද්‍රව්‍යය යොදා ජීවාණුහරණය කිරීම.

මේවායින් සත්‍ය වනුයේ,

i) A හා C ය. ii) B හා C ය. iii) A හා B ය. vi) A,B හා C සියල්ල ම.

35) සිසුවෙක් විසින් පැළ දැඩි කිරීම සඳහා අනුගමනය කල පියවරක් වනුයේ,
i) දිනපතා ජලසම්පාදනය කිරීම යි.
ii) ජලය යොදන කාලාන්තරය අඩුකිරීම යි.
iii) සූර්යාලෝකයට නිරාවරණය කරන කාලය අඩුකිරීම යි.
iv) සූර්යාලෝකයට නිරාවරණය කරන කාලය වැඩි කිරීම යි.

36) පසෙන් ජලය ඉවත් වන ක්‍රම වන්නේ,
i) ඇලි බාදනය හා විසිරි බාදනය මඟිනි.
ii) මතුපිට අපධාවය හා ඇලි බාදනය මගිනි.
iii) වාෂ්පිකරණ උත්ස්වේදනය හා ගැඹුරු වැස්සීම මඟිනි.
iv) විසිරි බාදනය හා මතුපිට අපධාවය මගිනි.

37) පසට වසුන් යෙදීමේදී භාවිතා කරන ස්වභාවික වසුන් සඳහා උදාහරණ වනුයේ,
i) පොලිතීන්, කොහුබත් හා කඩදාසිය.
ii) පොලිතීන්, වියළි වල්පැළෑටි හා කොහුබත්ය.
iii) කඩදාසි, පිදුරු හා පොල් අතු ය.
iv) පොල් අතු, පිදුරු හා කොහුබත් ය.

38) තීරු ජල සම්පාදන ක්‍රම භාවිතා කිරීමට යෝග්‍ය බෝග වනුයේ,
i) සෝයාබෝංචි, මුං හා කවුපි ය.
ii) වී, මුං හා මිරිස්ය.
iii) මුං, මිරිස් හා කව්පි ය.
iv) සෝයා බෝංචි, කෙසෙල් හා බඩඉරිඟු ය.

39) දී ඇති රූපසටහනට අනුව ඊට අදාල ජල සම්පාදන ක්‍රමය වනුයේ,



i) ඇලි හා වැටි ජල සම්පාදනය යි.
ii) බේසම් ජල සම්පාදනය යි.
iii) තීරු ජල සම්පාදනය යි.
iv) විසිරි ජල සම්පාදනය යි.

40) ජල සම්පාදන ක්‍රම වලින් ඉතාම කර්යක්ෂම හා සූක්ෂම ජල සම්පාදන ක්‍රමය කුමක්ද?
i) බිංදු ජල සම්පාදනය ii) ඉසින ජල සම්පාදනය
iii) බේසම් ජල සම්පාදනය iv) වළලු ජල සම්පාදනය.

* * * * *

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Provincial Department of Education - NWP**

**10 ශ්‍රේණිය** | දෙවන වාර පරීක්ෂණය - **2024** | **81 S II**

නම: ..........................................

**කෘෂි හා ආහාර තාක්ෂණය - II**

උපදෙස් :
- **I වන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න <u>පහකට</u> පමණක් පිළිතුරු සපයන්න.**

01) ඉහළ වාරි තාක්ෂණයක් සහිතව ස්වයං පෝෂිත ආර්ථික රටාවක් පැවති ශ්‍රී ලංකාවේ විදේශ ආක්‍රමණ වලින් පසු වැවිලි බෝග මත පදනම් වූ වාණිජ කෘෂි ආර්ථිකයක් බිහිවිය. වර්තමානයේ ගෙවතු වගාව යලි ජනප්‍රිය වෙමින් පවතී.

i) පෘතුගීසි හා ඉංග්‍රීසි පාලන සමයේ ලංකාවට හඳුන්වා දුන් පළතුරු වර්ග හතරක් නම් කරන්න.

ii) බ්‍රිතාන්‍යයන් විසින් ආරම්භ කරන ලද වැවිලි බෝග හතරක් නම් කරන්න.

iii) ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු ආරම්භ කරන ලද බහු කාර්යය යෝජනා ක්‍රම දෙකක් සඳහන් කරන්න.

iv හරිත විප්ලවය මගින් හඳුන්වා දුන් නව කෘෂිකාර්මික යෙදවුම් දෙකක් සඳහන් කරන්න.

v) බෝග වගාවට බලපාන දේශගුණික සාධක දෙකක් නම් කරන්න.

vi) පසේ අඩංගු පාංශු සංඝටක දෙකක් නම් කරන්න.

vii) ගෙවතු වගාවකදී ප්‍රාථමික බිම් සැකසීම සඳහා යොදාගත හැකි අතින් ක්‍රියාකරන උපකරණ දෙකක් නම් කරන්න.

viii) ගෙවත්තක බෝග සංස්ථාපනය කළහැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න.

xi) රෝපණ ද්‍රව්‍ය ලබාගැනීම සඳහා සකස් කරනු ලබන බිම් තවාන් පාත්ති වර්ග දෙකක් නම් කරන්න.

x) පාංශු ඛාදනය නිසා වගා බිමකට ඇතිවන අහිතකර ප්‍රතිඵල දෙකක් සඳහන් ලියන්න.

02) ශ්‍රී ලංකවේ ආහාර සුරක්ෂිතතාව ඇතිකිරීම සඳහා ප්‍රධාන මෙහෙයක් ඉටුකරන්නේ කෘෂි කර්මාන්තයයි.

i) a) ආහාර සුරක්ෂිතතාව කෙටියෙන් හඳුන්වන්න.
b) ආහාර සුරක්ෂිතතාව කෙරෙහි බලපාන ප්‍රධාන සාධක තුන කුමක්ද?

ii) ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට දායකත්වය සපයන ප්‍රධාන අංශ තුනක් සඳහන් කරන්න.

iii) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සඳහා ඇතිවන විභව තුනක් ලියන්න.

03) බෝග වගාවේදී ප්‍රශස්ත අස්වැන්නක් ලබාගැනීම සඳහා කාලගුණික පරාමිතිවල බලපෑම පිළිබඳ දැනසිටීම වැදගත් වේ.

i)




A රූපය




B රූපය

a) A රූපයේ ඇති උපකරණය කුමක්ද?

b) A රූපයේ X හා Y ලෙස දක්වා ඇති කොටස් නම් කරන්න.

c) B රූපයේ දත්ත යොදාගෙන සාපේක්ෂ ආර්ද්‍රතාවය ගණනය කරන්න.

ii) යම් ප්‍රදේශයක උෂ්ණත්වය වෙනස්වීම කෙරෙහි බලපාන සාධක තුනක් සඳහන් කරන්න.

iii) බෝග වගාවට සුලඟින් සිදුවන අහිතර බලපෑම් තුනක් ලියන්න.

04) පසක ලක්ෂණ, අඩංගු ද්‍රව්‍ය සහ පස ඒක ගැනීම ද බෝග වගාවට අත්‍යාවශ්‍ය වේ.

i) a) පසක් ආම්ලික වීමට හේතු දෙකක් සඳහන් කරන්න.

b) රතු දුඹුරු පසක දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

ii) a) පසක් තද වීමට බලපාන හේතු දෙකක් ලියා දක්වන්න.

b) පසේ තද බව නිසා ඇතිවන අහිතකර බලපෑම් හතරක් ලියන්න.

iii) a) පාංශු ඛාදන කාරක දෙකක් නම් කරන්න.

b) පාංශු ඛාදනයේදී අංශු එකිනෙකින් වෙන්වීම අවම කිරීමට ගත හැකි ක්‍රියා දෙකක් ලියන්න.

05) වස විසෙන් තොර එළවළු හා පලතුරු ලබාගත හැකි හොඳම ස්ථානය වන්නේ ගෙවත්තයි.

i) a) බඳුන් තවාන් ලෙස යොදගත හැකි ද්‍රව්‍ය හතරක් ලියන්න.

b) තවාන් පාලනයේදී ඇති වැදගත්කම් දෙකක් ලියන්න.

ii) a) තවාන් සඳහා සුදුසු ස්ථානයක් තේරීමේදී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න.

b) තවානක් සඳහා යොදාගනු ලබන තවාන් මිශ්‍රණය කුමක්ද?

iii) තවන් පාත්ති සැකසීමේ පොදු පියවර හතරක් ලියන්න.

06) නිවැරදි ලෙස බිම් සකස් කිරීම මගින් පසෙහි භෞතික ගුණාංග දියුණු වී ශාකවල මනා වර්ධනයක් සිදුවේ.

i) a) පසෙහි දියුණුවන භෞතික ගුණාංග දෙකක් නම් කරන්න.

b) බිම් සැකසීමේ අරමුණු දෙකක් ලියන්න.

ii) a) අතුරුයත් ගෑමේ උපකරණ හතරක් නම් කරන්න.

b) මූලික බිම් සැකසීමෙ පියවර දෙකක් නම් කරන්න.

iii) බෝග සංස්ථාපනයේදී නිවැරදි ගැඹුර හා නිවැරදි පරතර භාවිත කිරීමේ ප්‍රයෝජන දෙකක් ලියන්න.

07) බෝග වගා කිරීමේදී ජල සම්පාදනය ඉතා වැදගත් වේ.

i) a) බෝග වලට ජල සම්පාදනය කිරීමේදී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න.

b) පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රම දෙකක් ලියන්න.

ii) ඉසින ජලසම්පාදනයේ අවාසි තුනක් ලියන්න.

iii) දුර්වල ජලවහනය නිසා ඇතිවන ගැටළු තුනක් ලියන්න.

* * * * *